# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 ජූලි මස 06 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2018.07.09 දින නිකුත් කරන ලදී)**

## මහජන බැංකු (සංශෝධන)

**1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමඟින් බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය වැඩි කිරීමක් සිදු වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ණයකර නිකුත් කර යම් මුදලක් රැස්කිරීම සඳහා බැංකුවට හැකියාව ලබා දෙමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 3 වන වගන්තිය මඟින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 3 වන වගන්තිය මඟින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.—ඕ. 46/2013

## 1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක        දරන මහජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

1961 අංක 29 දරන පනතේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රාග්ධනය.

12. (1) බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් පනහ බැගින් වූ කොටස් බිලියනයකට බෙදන ලද රුපියල් බිලියන පනහක් විය යුතු ය.

(2) (අ) ජාතික ආර්ථිකයේ යහපත පිණිස අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ණය ප්‍රදානය කිරීම සඳහා ඍණපත්‍ර නිකුත් කිරීම මඟින් බැංකුව විසින් මුදල් රැස්කරනු ලැබිය හැකි බව.

20. (1) දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා 15 (1) (ආ) වගන්තිය යටතේ බැංකුව වෙත රජය විසින් ණයට දෙනු ලබන මුදල්වලට අතිරේකව, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව බැංකුව විසින් ඍණපත්‍ර නිකුත් කිරීම මඟින් මුදල් රැස්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, “අමාත්‍යවරයා” යන්නෙන්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ.”.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීම මඟින්; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීම මඟින්.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීම මඟින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.